207974

7 JAN 1987

සමාජ අධ්‍යයනය



6 වසර

207974

24 NOV 1987

සමාජ අධ්‍යයනය

6 වසර

අලුත් නිර්දේශ මාලාව අනු ව

සැකසිණි

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

2015705

1 වන මුද්‍රණය 1986
2 වන මුද්‍රණය 1987
යියලු හිමිකම් ඇවිරිණි

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින්
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ මුද්‍රණය කොට පළ කරන ලදි.

87/සි/86 (315000)

ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී .....ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරි බරිනී සුරැඳි අති සෝභමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජයභූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා.....
ඔබ වේ අප විද්‍යා
ඔබ මය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජයභූමි කරා
එක මවකගෙ දරු කැළ බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා.....

නිදහස් අධ්‍යාපනයේ නිසි පල නෙළා ගැනීමට නම් පාසල් පොත් නොමිලේ ම දිය යුතු යැ යි හතළිස් වසරකට පෙර, ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් විසින් කරන ලද යෝජනාව 1980 සිට මල් පල ගැන්වී මේ පොත ඔබට මෙ සේ ලැබෙයි.

ඉගෙනුම සපල කොට
හොඳ අයකු වනු දැක්මේ
පැතුමෙන් රජය ඔබ හට
දෙන කිළිණයකි මේ පොත

මෙය හොඳින් රැක ගෙන
කියවා ඉගෙන මැනවින්
නැණ ගුණ දියුණු කර ගෙන
වන්න හොඳ පුරවැසියන්

සිංහල ය දෙමළ ය
මුස්ලිම් ය යනු අපි ම ය
මෙ හැම එක් වීමෙනි සිරි
ලක සුරපුරක් වන්නේ.

ලයනල් ජයතිලක
අධ්‍යාපන සේවා ඇමති.

සංඥාපනය

මෙම පොත 6 වසර සඳහා නැවත මුද්‍රණය කරන ලද්දකි.

මෙය නැවත මුද්‍රණය සඳහා සකස් කිරීමේ දී නන් අයුරින් සහාය වූ සියලු දෙනාට මගේ අවංක ස්තුතිය පිරිනමමි.

එම්. කේ. ජේ. ඒ. අල්විස්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්

1987 මාර්තු මස 02 වැනි දින,
කොළඹ 10,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දී ය.

පෙර වදන

1985 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන සංශෝධිත විෂය මාලාවට අනුකූල ව 6 වන ශ්‍රේණිය සඳහා ලියන ලද සමාජ අධ්‍යයනය පොත මෙය වේ.

තමා ජීවත් වන පරිසරය හා එයි ඇති විවිධ ලක්ෂණ ද එහි ඉතිහාසය ද පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමටත් ශ්‍රී ලාංකික ජාතික ගීය හා ජාතික කොඩිය පිළිබඳ ව දැනුමක් ලබා ගැනීමටත් මේ පොත ඉවහල් වේ.

මේ වැට ඉතිහාසය පිළිබඳ ව ශිෂ්‍යයනට අවබෝධයක් ලබා ගැනීමට ඉඩකඩ සලසා දීම් මෙහි ඇති විශේෂ ලක්ෂණයකි.

ඉතා කෙටි කාලයක් තුළ දී මහත් පරිශ්‍රමයකින් යුතු ව සැකසුණු මෙම පොත සඳහා වෙහෙස - මහන්සි වී කටයුතු කළ සියලු ම ලේඛක ලේඛිකාවන්ටත් උප-දේශක මණ්ඩලයටත් මගේ කෘතඥතාව පුද කරමි.

එච්. ආර්. චන්ද්‍රසේකර
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
මහවල්කම් කාර්යාල සංකීර්ණය,
නැ. පෙ. 520,
කොළඹ 10.
1986 ජූනි මස 01 වන දින දී ය.

මෙහෙයවීම

එච්. ආර්. චන්ද්‍රසේකර මයා — හිටපු අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්

උපදේශක මණ්ඩලය

ඩී. ජී. පෙරේරා මයා — ප්‍රධාන අධ්‍යාපන උපදේශක
එච්. ආර්. චන්ද්‍රසේකර මයා — හිටපු අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
එම්. එම්. ප්‍රේමරත්න මයා — අධ්‍යක්ෂ, විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය
වීමලා රත්නායක මිය — විදුහල්පති, ප්‍රෙස්බිටේරියන් බා. ම. වි., කොළඹ
ලතිකා ගුණවර්ධන මිය — වෙල්ස් කුමාර විදුහල, තොරටුව
යරත්චන්ද්‍ර ජයවර්ධන මයා — විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය
වීවා වික්‍රමගේ මිය — ශ්‍රී ජයවර්ධනපුර මහා විදුහල, කෝට්ටේ

ලේඛක මණ්ඩලය

කේ. ඊ. පෙරේරා මිය — ගුරු උපදේශක, කලුතර
ලිසී දෙල්පවිත්‍ර මිය — ගුරු උපදේශක, කොළඹ
බී. එල්. රෝහණ කුමාර මයා — ගුරු උපදේශක, ගම්පල
එස්. ඒ. දිසානායක මයා — ගුරු උපදේශක, මීනුවන්ගොඩ
ඩබ්. ඒ. ඩී. එස්. යාපා මිය — ගුරු උපදේශක, ගම්පහ
වී. රත්නායක මයා — ගුරු උපදේශක, දෙවිනුවර
එස්. එම්. දයානන්ද මයා — ගුරු උපදේශක, කුලියාපිටිය

සංස්කරණය

භයසින්ත් දහනායක මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
එම්. සී. ද සිල්වා මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
පද්මිනී එන්. පෙරේරා මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
රංජනී සේනානායක මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිතියම් හා චිත්‍ර

ඩබ්ලිව්. ඒ. යුමතිපාල මයා — විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය

පිටකවරය

සෝමසිරි හේරත් මයා — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පටුන

පරිච්ඡේදය		පිටුව
1.	අපේ පාසල	3
2.	පාසලේ ඉතිහාසය	10
3.	පාසල් සමාජය	16
4.	පාසලේ භෞතික පරිසරය	24
5.	ගම / නගරය	33
6.	ගමේ / නගරයේ භෞතික පරිසරය	36
7.	ගමේ / නගරයේ සම්පත්	42
8.	ගමේ / නගරයේ මිනිසුන් හා මිනිස් කටයුතු	45
9.	අපේ ගමේ / නගරයේ ඉතිහාසය	59
10.	ගමේ / නගරයේ පාලනය	65
11.	ජාතික ගීය — ජාතික කොඩිය — රාජ්‍ය ලාංඡනය	69
12.	අප රටේ ඉතිහාසය	76
13.	පෙරදිග මුතු ඇටය යි මේ	85
14.	රටේ මිනිසුන් හා මිනිස් කටයුතු	104
15.	විවිධත්වය සහ ඒකීයත්වය	116

1

ඒකකය

අපේ පාසල

1

අපේ පාසල

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවක වශයෙන් ගත කරන අවුරුදු කිහිපය බොහෝ විට ඔබේ ජීවිතයේ ප්‍රීතිමත් ම කාලය විය හැකි ය. පාසලේ දී ඔබට බොහෝ දේ ඉගෙන ගැනීමට පුළුවන. පන්ති කාමරය තුළ දී ඔබට අනෙකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇසුරු කිරීමට ඉඩ ලැබේ. ක්‍රීඩා පිටියේ දී ඔබ එකිනෙකා හා තරඟ වැදුණ ද ජය පරාජය සතුටු සිතින් බාර ගැනීමට පුරුදු වී සිටින්නෙහි ය.

ඔබේ පාසල පටන් ගන්නේ උදයේ නියමිත වේලාවකට ය. සෑම සතියක ම නියමිත දිනයක විදුහලේ පොදු රැස්වීම පැවැත්වේ. එහි දී සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් දෙකක් වේ. ඉන් එකක් නම් පාසල් ගීතය ගායනා කිරීම ය. අනෙක නම් පාසල් කොඩිය එසවීම ය.

1.1 පාසල් ගීය

අප රටේ බොහොමයක් පාසල්වලට පාසල් ගීතයක් ඇත. ඔබේ පාසල් ගීතය ගැන ඔබ විමසිලිමත් වී තිබේ ද ?

ක්‍රියාකාරකම

1. ඔබ පාසලේ පාසල් ගීයක් තිබේ නම් එය මෙහි ලියන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

2. පාසල් ගීතය පන්තියේ දී සාමූහික ව ගායනා කරන්න.

3. පාසල් ගීතය ගායනා කරනු ලබන අවස්ථා තුනක් විමසා දැන ගන්න.

(අ) .....

(ආ) .....

(ඇ) .....

4. පාසල් ගීතය ගායනා කරන අවස්ථාවක ඔබ හැසිරිය යුතු ආකාරය ඔබේ ගුරු මහතා / මහත්මි-යගෙන් අසා දැන ගන්න.

5. ඔබේ පාසල් ගීතයේ අර්ථය සරල ව ලියන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

ඔබේ සහෝදර සහෝදරියන් වෙනත් පාසල්වල ඉගෙනීම් ලබනවා විය හැකි ය. ඔවුන් ගේ පාසල් ගීතයන් විමසා බලන්න. සහෝදර සහෝදරියන් නොමැති නම් ඔබගේ මිතුරන් යන පාසල්වල පාසල් ගීත විමසා බලන්න. බොහෝ පාසල් ගීතවල පහත සඳහන් ලක්ෂණ අඩංගු වී දැනී ඔව ඔබට වැටහී යනු ඇත.

i. පාසල ම්වක මෙන් සලකා ආමන්ත්‍රණය කර තිබීම.
ii. පාසලට ගෞරවාදරය දක්වන බව
iii. පාසල් රැක ගැනීම පාසල් දරු දරියන්-ගේ යුතුකම බව.

1.2 පාසල් කොඩිය

අප රටේ බොහොමයක් පාසල්වලට කොඩියක් ඇත. ඔබේ පාසලේ ද එ වැනි කොඩියක් ඇත් නම් එම කොඩිය පන්තියට ගෙනෙන්න.

ක්‍රියාකාරකම්

1. ඔබේ පාසල් කොඩිය චිත්‍රයකට නඟන්න.

2. එහි ඇති වර්ණවලින් හා සංකේතවලින් නිරූපණය වන්නේ ඉමානවා දැයි දක්වන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

3. පාසල් කොඩිය භාවිත කරන අවස්ථා කිහිපයක් ගුරු මහතාගෙන් අසා දැන ගන්න.

4. පාසල් කොඩියට අප ගරු කළ යුත්තේ ඇයි දයි දක්වන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

1.3 පාසල් ලාංඡනය

පාසල් ගීතය, පාසල් කොඩිය හැරුණු විට යම පාසලක් නියෝජනය කිරීමට භාවිත කෙරෙන සංකේතයක් ගැන ඔබ දන්නෙහි ද ? එය පාසල් ලාංඡනය යි.

අප ධෛර්යමත් කරන සුදු වාක්‍යයෝ හෝ ජීවිතයට ආදර්ශයක් ලැබෙන පාඨයක් ද එහි ඇතුළත් කොට ඇත. මෙම පාඨය විවිධ භාෂාවන්ගෙන් දක්වා තිබීම ද විශේෂ ලක්ෂණයකි.







1.1 රූපය.
ආදර්ශ පාසල් ලාංඡන කිහිපයක්

ක්‍රියාකාරකම්:

1. ඔබෙ පාසලේ පාසල් ලාංඡනයක් ඇත් නම් එය මෙහි අඳින්න.

2. ඔබෙ පාසල් ලාංඡනයේ දක්නට ඇති සංකේත මොනවා ද යි දක්වන්න.

.....

.....

.....

.....

.....

.....

3. ඔබෙ පාසල් ලාංඡනයේ අඩංගු ආදර්ශ පාඨය ලියා එහි අර්ථය දක්වන්න.

.....

.....

.....

.....

.....

4. කවර අවස්ථාවල දී පාසල් ලාංඡනය භාවිත කරනු දැයි සොයා බලන්න.

.....

.....

.....

.....

5. මෙම ආදර්ශ ලාංඡනවල ආදර්ශ පාඨ භාෂා කිහිපයකින් ලියැ වී ඇති බව ඔබට පෙනෙනු ඇත. ඒවා පසුබිම් වී ඇති ආකාර විමසන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

2. මු.ස. 87390

2

පාසලේ ඉතිහාසය

"ඔබගේ උපන් දිනය කවද ද"? යනුවෙන් කිසිවකු ඇසුවොත් ඔබ උපන් දිනය ඔහුට පවසනු ඇත. එය දැන ගත්තේ දෙමවුපියන්ගෙන් විය හැකි ය. එම දිනය නිවැරදි දැයි ඔබ කිසි යම් විටක සොයා බැලුවේ ද? එහි නිවැරදි බව සොයන්නේ කෙසේ ද? ඔබගේ උප්පැන්න සහතිකය ගෙන බැලුවොත් එහි ඔබගේ උපන් දිනය නිවැරදි ව සඳහන් කොට ඇත. දෙමවුපියන්ගෙන් අසා දැන ගත් උපන් දිනයක්, උප්පැන්න සහතිකයේ උපන් දිනයක් සමාන ද යි සසඳා බලන්න.

උපන් දිනය හැරුණු විට ඔබේ ජීවිතයේ වෙනත් වැදගත් අවස්ථාවන් කිහිය හැකි ය. පළවු වරට අකුරු කියවීම, පාසලට ඇතුළු වීම, පාසලේ දී පන්තියෙන් පන්තියට උසස් වීම, ක්‍රීඩා තරහවලට සහභාගි වීම හා ජයග්‍රහණයන් ලබා ගැනීම, කෘෂ්ණ ප්‍රදනෝත්සවයේ දී නැගි දිනා ගැනීම ආදිය ඔබේ ජීවිතයට අදළ සිද්ධීන් කිහිපයකි. මෙම සිද්ධීන් හා සම්බන්ධ දින සමහරක් ඔබට මතක ඇතුවාට සැකයක් නැත. ඔබට මතක නැති දිනයන් දෙමවුපියන්ගෙන් අසා දැන ගත හැකි ය. ඔබේ ජීවිතයේ එම වැදගත් සිදුවීම් යියල්ල අනු පිළිවෙළට ගලපන ලද වාර්තාවක් ඔබගේ ඉතිහාසය ලෙස හැඳින්වීමට පුළුවන.

2.1 පාසලේ ඉතිහාසය

ඔබට මෙන් ම ඔබගේ පාසලට ද ඉතිහාසයක් ඇත. මෙම පාඨමෙන් අප උත්සාහ කරන්නේ අප පාසලේ ඉතිහාසය සොයා බැලීමට ය. ඔබගේ ගුරුතුමාගේ හෝ ගුරුතුමියගේ මග පෙන්වීම යටතේ ඔබ පාසලේ ඉතිහාසය ගොඩ නැඟා ගැනීමට උත්සාහ ගන්න.

මේ ඉතිහාසය ගොඩ නඟා ගැනීමට උපකාරී වන්නේ පාසලේ ඇති ලිපි ලේඛන, ගොඩනැගිලි, පාසල විවෘත කරන විට සවි කරන ලද පුවරුව, පාසල් සඟරා ආදිය යි. මේ අන්දමට ඉතිහාසය ගොඩ නැඟීමේ දී ප්‍රයෝජනයට ගන්නා දේවලට අපි "මූලාශ්‍ර" යන නම භාවිත කරමු. මෙවා අතුරෙන් වඩාත් ම වැදගත් වන්නේ ලොග් පොත යි. මීට අමතර ව ආදි සිසුන්ගෙන්, ප්‍රදේශයේ වැඩිහිටියන්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ ආදි විදුහල්පතිවරුන්ගෙන් පාසල පිළිබඳ තොරතුරු දැන ගත හැකි ය. මේ අනු ව ඔබ පාසල පිළිබඳ ඉතිහාසය වාචික ව ලැබෙන තොරතුරුවලින් ද ලිඛිත තොරතුරුවලින් ද දැන ගැනීමට පුළුවන.

ක්‍රියාකාරකම්

1. පාසල පිළිබඳ ව දන්නා පූජකවරයකු, ගුරුවරයකු හෝ පාසල් පරීක්ෂකවරයකු වැනි කෙනෙකුගෙන් පහත සඳහන් කරුණු ඒ නම්

   (අ) පාසල ආරම්භ කළ වර්ෂය

   (ආ) එහි මුලින් සිටි ගුරු සංඛ්‍යාව

   (ඇ) එහි සිටි ශිෂ්‍ය සංඛ්‍යාව

   (ඈ) පාසලේ ආදි කර්තෘගේ නම

   (ඉ) එහි වූ මුල් ගුරුතුමාගේ නම

   (ඊ) පාසලේ ගොඩනැඟිලි සංඛ්‍යාව — පිළිබඳ ව සොයා දැනගන්න.

2. ගුරුතුමාගේ / ගුරුතුමියගේ ආධාර ලබා පාසලේ ආදි ශිෂ්‍යයකු ගෙන්වා පාසල පිළිබඳ කථාවකට සවන් දෙන්න.

3. ඔබ කලින් සොයා ගත් කරුණු ද ආදි ශිෂ්‍යයාගේ කථා අසා ගොනු කර ගත් කරුණු ද අනු ව පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

   i. පාසල ආරම්භ කළ වර්ෂය .....

   ii. එහි මුල දී සිටි ගුරු සංඛ්‍යාව .....

   iii. පාසලට ගිය මුල් ශිෂ්‍ය සංඛ්‍යාව .....

   iv. පාසලේ ප්‍රථම මුල් ගුරුතුමාගේ නම .....

   v. පාසලේ ආදි කර්තෘගේ නම .....

   vi. පාසලේ ගොඩනැඟිලි සංඛ්‍යාව .....

4. ඔබ පාසල ආරම්භ වී ඇත්තේ රජයේ පාසලක් ලෙස විය හැකි ය. එය කිසියම් ආගමික සංවිධානයක් විසින් පිහිටුවන ලද්දක් විමට පුළුවන. ඔබ පාසල අයත් වන්නේ කුමන වර්ගයකට ද?

පාසලේ නම	රජයේ	ආගමික

5. එය ආගමික සංවිධානයක් මඟින් පිහිටුවනු ලැබුයේ නම් එය අයත් වන්නේ කුමන ආගමික සංවිධානයකට ද? හරි පිළිතුර ඉදිරියේ √ දමන්න.

   i. බෞද්ධ iii. ඉස්ලාම් v. කතෝලික

   ii. හින්දු iv. ක්‍රිස්තියානි

6. ඔබ පාසලේ ඇති පැරණි ලියකියවිලි අනු ව ද ඉහත ඔබ සෙවූ තොරතුරු ම රැස් කරන්න. ලිපි ලේඛන පුවරු ආදියේ සටහන් වන දෑ වඩා නිවැරදි ය. ඔබ කලින් සොයාගත් තොරතුරු මේවා සමඟ සසඳන්න.

7. ඔබ රැස් කර ගත් නිවැරදි තොරතුරු යටින් ඉරක් ගයන්න.

8. නිවැරදි තොරතුරු යොදා "මගේ පාසල" යන මාතෘකාව යටතේ කුඩා රචනයක් ලියන්න.

9. **ඔබගේ** පාසලේ ආරම්භයේ සිට මේ දක්වා සිටි විදුහල්පතිවරුන්ගේ නාම ලේඛනයක් පිළියෙළ කරන්න.

විදුහල්පති තුමාගේ නම	කාල සීමාව (වර්ෂ සඳහන් කරන්න.)

10. **ඔබ** විසූහලේ **සිටි** වැදගත් **ආදි ශිෂ්‍යයන්**ගේ නාම ලේඛනයක් සකස් කරන්න. රටේ හෝ ප්‍රදේශයේ හෝ වැදගත් පුද්ගලයන් බවට පත් ව ඇති දැනට ජීවත් ව සිටින ආදි ශිෂ්‍යයන් පමණක් තෝරා ගන්න.

ආදි ශිෂ්‍යයාගේ නම	දැනට දරන තනතුර හෝ ප්‍රසිද්ධියක් දැරීමට හේතුව	පාසලේ සිටි කාලය
.....	.....	.....
.....	.....	.....
.....	.....	.....

3

පාසල් සමාජය

ඔබ උපතින් ම කිසියම් පවුලක සාමාජිකයෙක් වේ. ඔබ දන්නා පරිදි ඔබගේ දෙමව්පියන් සහ ඔබ දැනුවත් සොහොයුරු සොහොයුරියන් පවුලේ සාමාජිකයෝ වෙති. මෙය ඔබ ඇතුළු වන ප්‍රථම ම සහ කුඩා ම සමාජය යි. ඔබට අවශ්‍ය වන ආරක්ෂාව, ආදරය, පෝෂණය, සෞඛ්‍යය, ඇඳුම් පැළඳුම් හා නිවාස යන අවශ්‍යතා පවුලෙන් බොහෝ දුරට ඉටු වේ. ළදරු විය පසු කොට ක්‍රමයෙන් ටියව් පා නවන ඔබ, දෙමව්පියන් විසින් පාසලට

ඇතුළත් කෙරේ. එවිට ඔබ පාසල් සමාජයේ **සාමාජිකයකු** බවට පත් වේ.

3.1 පාසල් සමාජයේ විවිධතා

සමාජයේ සංවිධානවල ඇති විවිධත්වය පාසලේ ද ඇත. ඒ විවිධත්වය නිසා ඔබට පාසල් ජීවිතය රසවත් එකක් වේ. සිංහල පාසල, පිරිමි, ගැහැණු හෝ මිශ්‍ර පාසලක් විය හැකි ය. පාසල මිශ්‍ර පාසලක් නම් එහි ගැහැණු ළමෝ හා පිරිමි ළමෝ සිටිති. සමහර විට පාසලේ විවිධ වර්ග වලට අයත්, විවිධ ආගම් අදහන සිසුන් ද සිටිය හැකි ය. එම වෙනස්කම් හඳුනා ගැනීම සඳහා ඔබ පාසල ඇසුරින් පහත දී ඇති වගුව සොයා සම්පූර්ණ කරන්න.

ක්‍රියාකාරකම්

(1)

වසර	පිරිමි	ගැහැණු	එකතුව
භය වසර			
සත වසර			
පහ වසර			
හතර වසර			
මුළු එකතුව			

(2)

වර්ගය	6 වසර	7 වසර	5 වසර	4 වසර
සිංහල				
දෙමළ				
මුස්ලිම්				
බර්ගර්				
වෙනත්				
මුළු එකතුව				

(3)

අදහන ආගම	6 වසර	7 වසර	5 වසර	4 වසර
බෞද්ධ				
හින්දු				
ඉස්ලාම්				
ක්‍රිස්තු ධර්මය (රෝමානු කතෝලික)				
ක්‍රිස්තු ධර්මය (රෝමානු කතෝලික නොවන)				
මුළු එකතුව				

4. ඉහත වගු තුන යටතේ ඔබ රැස් කළ තොරතුරු සරල කීරු ප්‍රස්තාරවලට නඟන්න.

(i)

(ii)

(iii)

3.2 පාසලේ සමානාත්මතාව හා ඒකීයත්වය

ඉහත වගුවලින් පෙන්නුම් කැරෙන විවිධතා කිහිනත් පාසලේ සෑම සාමාජිකයෙකුට ම හැකියාවන්. පහසකම් සහ අයිතිවාසිකම් තිබේ. එසේ වුවත් විවිධ දක්ෂතා අනුව ඔවුන් අතර වෙනස්කම් තිබිය හැකි ය. ඔබ පාසල් සමාජයට ඇතුළු වී සිටිනුයේ තම තමන්ගේ හැකියා හා දක්ෂතා වැඩි දියුණු කර ගනිමින් අධ්‍යාපනය ලැබීමට ය. එනිසා ඔබ සියලු දෙනා ම එක සමාන අරමුණක් ඉටු කර ගැනීමට උත්සාහ කරත්. එ වැනි පොදු අරමුණක් කරා යාමට සහයෝගයෙන් හා සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතු ය. පාසල් ලාංඡනය, ධජය, ආදර්ශ පාඨය හා ගීතය යන ඒවායින් පිළිබිඹු වන්නේ ද මේ එකමුතුබව යි.

3.3 පාසල් සිසුන්ගේ යුතුකම් හා අයිතිවාසිකම්

පාසල් සමාජය ඔබට ලබා දී ඇති අවස්ථා ප්‍රයෝජනයට ගෙන ඔබේ දක්ෂතාවන් වැඩි දියුණු කර ගැනීම ඔබ සතු යුතුකමකි. ඉගෙනීම ඔබේ අයිතියකි. එමෙන් ම අනුන්ගේ ඉගෙනීමට බාධා නොකිරීම ඔබේ යුතුකමකි. ඔබ යුතුකම් ඉටු නොකරන්නෙහි නම් අන් සිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා නොවේ. පාසල් සමාජය තුළ ඔබට තවත් මෙබඳු අයිතිවාසිකම් හා යුතුකම් මාලාවක් වේ.

ක්‍රියාකාරකම්

1. පාසල් සමාජය තුළ ඔබට හිමි අයිතිවාසිකම් හා යුතුකම් පහත වගුවේ ලියා දක්වන්න.

අයිතිවාසිකම්	යුතුකම්

3.4 පාසලේ පාලනය



ක්‍රියාකාරකම්

1. ඉහත රූප සටහන ආශ්‍රය කරගෙන ඔබ විදුහලේ පාලන සංවිධානය මෙහි පහත දක්වන්න.

ඔබ අයත් වන පවුල නමැති සමාජයේ එදිනෙදා වැඩ කටයුතුවල යම් ක්‍රියා පිළිවෙළක් ඇති බව ඔබ දන්නෙහි ය. පවුලේ ප්‍රධානියා වශයෙන් සැලකෙන්නේ පියා ය. පවුලේ දියුණුව සඳහා ක්‍රියා කිරීමේ දී නොයෙකුත් වගකීම් ඔහුට පැවරී ඇත. හොඳෝ විට එම වගකීම් ක්‍රියාත්මක වන්නේ නීති රීති මඟින් නොව එකිනෙකා කෙරෙහි ඇති ආදරය, සෙනෙහස හා සම්ප්‍රදායන් මත ය.

ක්‍රියාකාරකම්

1. ඔබ පවුලේ විවිධ වැඩ කටයුතු සාමාජිකයන් අතර බෙදී ඇති අයුරු පහසා පටහන් කරන්න.

2 ඒවා හරියාකාර ව ඉටු වේ ද යි යොයා බලන්නේ කවුරුන් ද?

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

පාසලේ ඇති සංවිධානය ආරක්ෂා කර ගැනීම සඳහාත් අයිතිවාසිකම් හා යුතුකම් රැකගැනීම සඳහාත් නීති රීති හා සම්ප්‍රදායයන් පවති. ඔබ පාසලේ ද එබඳු නීති රීති මාලාවක් හා සම්ප්‍රදායන් ඇත. පාසලක තිබිය හැකි නීති රීති හා සම්ප්‍රදායයන් කිපයක් පහත දක්වේ.

නීති රීති	සම්ප්‍රදායයන්
1. නියමිත වේලාවට පාසලට පැමිණිය යුතු ය.	1. පාසල ඇරඹීමට පෙර පාසල පිරිසිදු කර ගැනීම.
2. නියමිත වේලාවට පෙර අවසර නැති ව පාසලින් බැහැර නො යා යුතු ය.	2. පාසල ඇරඹීමට පෙර ආගම ඇදහීම.
3. නිතිපතා පාසලට පැමිණිය යුතු ය.	3. පාසල වැසීමට පෙර ආගම සිහි කිරීම.
4. නිල ඇඳුමෙන් සැරසී පැමිණිය යුතු ය.	4. පාසල් කොඩියට, පාසල් ගීයට හා පාසල් ලාංඡනයට ගෞරව දැක්වීම.

ක්‍රියාකාරකම්

1. ඔබ පාසලේ ක්‍රියාත්මක වන නීති රීති හා සම්ප්‍රදායයන් පහත ලියා දක්වන්න.

නීති රීති	සම්ප්‍රදායයන්

4

පාසලේ භෞතික පරිසරය

4.1 පාසලේ පිහිටීම

මීට පෙර පාඩම්වල දී ඔබේ පාසලේ ආරම්භය, ප්‍රගතිය, සංවිධානය හා පාලනය යනාදි කරුණු ගැන ඔබ ඉගෙන ගත්තෙහි ය. මෙම පාඩමෙන් ඔබේ පාසල පිහිටා ඇති පරිසරය පිළිබඳ ව ද ඔබ ඉගෙන ගන්නෙහි ය. ඔබේ පාසල ගමක හෝ නගරයක පිහිටා තිබෙන්නට පුළුවන.



4.1 රූපය. පාසලක පිහිටීම

මෙහි දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ගම්බද ප්‍රදේශයක පිහිටා ඇති පාසල් වත්තක් හා අවට පරිසරය දැක්වෙන චිත්‍රයකි. 4.2 රූපයෙන් දක්වා ඇත්තේ චිත්‍රයෙහි දැක්වෙන පාසල් වත්ත හා අවට ප්‍රදේශයේ බිම් සැලැස්ම ය. මහක්ටයාර් දෙකක් විශාල එම පාසල් වත්ත මෙහි කුඩා කර ඇත. පන්ති කාමරයට ආසන්නයේ සහ ඇතිත් වෙනත් ගොඩනැඟිලි කිහිපයක් පිහිටා තිබේ. එම ගොඩනැඟිලි හය වන වසරේ පන්ති කාමරයට කුමන දිසාවන්ගෙන් පිහිටා ඇති ද යි අධ්‍යයනය කරන්න.

පාසල් වත්ත අවට මායිම ද මෙහි දක්වේ. කරත්ත පාර, රබර් වත්ත හා පන්සල් වත්ත මායිම් වශයෙන් දක්විය හැකි ය.



4.2 රූපය. පාසල හා අවට බිම් සැලැස්ම

ක්‍රියාකාරකම්

1. ඔබේ පාසල් වත්තට ද මායිම් තිබේ. එම මායිම් ගුරුකුලා / කුලියගේ ආධාරය ඇති ව හඳුනාගන්න.

2. ඔබ ඉගෙන ගන්නා පාසල් වත්තේ දළ සැලැස්මක් මී ළඟ පිටුවෙහි අඳින්න. එහි ප්‍රධාන ගොඩනැඟිලි, ඇඳ පෙන්වා අවට මායිම් ද දක්වන්න.

3. ඔබේ පාසලට ආසන්න ව ඇති පොදු ගොඩනැඟිලි තිබේ නම් ඒවා නම් කරන්න.

.....

.....

.....

.....

.....

.....

.....

පාසල් වත්තේ ඵල ශාලාවම

4. පාසලට ළඟින් ම පිහිටා ඇති ගොඩනැඟිල්ල සහ ඇතින් ම පිහිටා ඇති ගොඩනැඟිල්ල නම් කරන්න.

.....

.....

.....

.....

5. පාසලේ සිට එම ගොඩනැඟිලි පිහිටි දිශාවන් හඳුනාගන්න.

ගොඩනැඟිල්ල	දිශාව
.....	.....
.....	.....
.....	.....

6. ඔබ පාසල පිහිටි ගමේ / නගරයේ තිබෙන වෙනත් වැදගත් පොදු ගොඩනැඟිලි මොනවා ද ?

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

(7) එම ආයතනයත්, ඔබ පාසලත් අතර දුර දළ වශයෙන් දක්වන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

8. ඔබ පාසල පිහිටා තිබෙන්නේ කුමන ග්‍රාම සේවක වසමක ද ?

.....

.....

9. (අ) කුමන දිස්ත්‍රික්කයේ ද ? :.....

.....

.....

10. (ආ) කුමන පළාතේ ද ? : .....

.....

.....

භූමිය පැළී තැන ම එක ම මට්ටමක පිහිටන්නේ නැත. සමහර තැන්වල භූමිය උස ය. සමහර තැන්වල භූමිය පහත් ය. භූ විෂමතාව කියන්නේ භූමියේ දකින්නට තිබෙන මේ වැනි වෙනස්කම්වලට ය. ඒවා ස්වාභාවික ව ඇති වී තිබෙන ලක්ෂණ ය. සමහර විට ඔබේ පාසල් වත්තේ පාසල් පිටිතනිය එක ම උස් මට්ටමකින් පිහිටි නැත්නම්, එය ස්වාභාවික ව පිහිටි කැන්නක් නො වැන්නට පුළුවන. එය සකස් කරන ලද්දක් විය හැකි ය. එසේ නම් එය කෘත්‍රිම සැකසීමකි.

නො තිබෙන්නට පුළුවන. සමහර පාසල් වතු සමතලා ය. මඳක් උස් ප්‍රදේශ එහි තිබෙන්නට ද පුළුවන. ඒ වැනි බිම් උස් බිම් වශයෙන් හඳුන්වන බව ඔබ අයා ඇත. කඳු වශයෙන් හඳුන්වන්නේ වඩාත් උසින් යුක්ත බිම් ය. ඔබේ පාසල් වත්තේ උස් ප්‍රදේශ පිහිටා ඇති නම් ඒවා පිහිටා තිබෙන්නේ කුමන දිශාවේ දැ යි සොයා බලන්න. වැසි දිනක පොළොවට වැටෙන ජලය ගලා බසින දිශාව ගැන සැලකිලිමත් වන්න. එකුර ගලන්නේ උස් බිමක සිට පහත් බිමකට බව ඔබ දන්නවා ඇත. එසේ නම් ඔබ පාසල් වත්ත බැලුම් වන දිශාවත් ඒ අනුව සොයා බලන්න.

ක්‍රියාකාරකම්

1. ඔබේ පාසල් වත්ත පහත් බිමක් ද? උස් බිමක් ද ?

.....

.....

2. වැසි දිනක එහි ජලය ගලා බසින්නේ කුමන දිශාවට දැයි නිරීක්ෂණය කර ලියන්න.

.....

.....

3. පාසල් වත්ත යදහා ඔබ පිළියෙළ කළ සැලැස්මේ එම දිශාව මෙ බදු ඊතල ⟶ ලකුණකින් දක්වන්න.

4. ජලය බැස යෑම නිසා ඇති වී තිබෙන ලක්ෂණ සොයා බලා වාර්තා කරන්න.

.....

.....

.....

.....

.....

.....

.....

4.3 ගසපැල

ඔබ පාසල් වත්තේ ස්වභාවයෙන් ම වැවෙන ගස්වැල් සහ වගා කරන ලද ගස් සහ පැළෑ
වර්ග නිරීක්ෂණයට ලුඑවන. පාසල් වත්ත නිරීක්ෂණය කොට පහත සඳහන් වගුව සම්පූර්ණ
කරන්න.

ක්‍රියාකාරකම

ගස් වර්ග	පැළෑටි වර්ග
.....	.....
.....	.....
.....	.....
.....	.....
.....	.....
.....	.....
.....	.....
.....	.....

2. ඔබ පාසල් වත්තේ ඖෂධ පැළෑටි කිසිවක් තිබෙ ද ? ඒවා තිබෙ නම් හඳුනාගෙන න
කරන්න.

.....

.....

.....

.....

.....

.....

3. ඔබ පන්තියේ සිසුන් එකතු වී ඖෂධ වශයෙන් වැදගත් වන පැළෑටි කිහිපයක් ද ආහ
වශයෙන් ගත හැකි පැළෑටි කිහිපයක් ද වගා කරන්න.

2

ඒකකය

අපේ ගම / නගරය

5

ගම / නගරය

ඔබ පාසල පිහිටි ගමෙහි හෝ නගරයෙහි නව කුමක් දැ යි කෙනෙකු ඔබෙන් ඇසුවොත් ඊට පහසුවෙන් පිළිතුරු දීමට ඔබට පුළුවන. එහෙත් එම ගමේ හෝ නගරයේ පිහිටීම පිළිබඳ ව ඇසුවොත් ඊට පිළිතුරු දීම එතරම් පහසු නැත. ඔබගේ පාසල පිහිටි ගමේ / නගරයේ පිහිටීම පිළිබඳ ව නිවැරදි ව දැන ගැනීමට නම් ඔබ දැන ගත යුතු කරුණු කිහිපයක් ම ඇත.

5.1 ගමේ නගරයේ පිහිටීම

ගමක් හෝ නගරයක් පිහිටන්නේ වෙනත් ගමකට හෝ නගරයකට ආසන්නව විය හැකි ය. ගමක්/නගරයක් ගහකින් මායිම් වන්නට පුළුවන. ගමක් නම් වන ලැහැබකට ආසන්න වන්නට පුළුවන. එම ගම / නගරය ශ්‍රී ලංකාවේ කිසියම් පළාතක කිසියම් දිස්ත්‍රික්කයක පිහිටා තිබේ. ගමක් කිසියම් ග්‍රාමසේවක වසමක් තුළ පිහිටා තිබෙන්නට පුළුවන. නගරයක් ග්‍රාම සේවක වසම් කිහිපයකින් සෑදුම් ලත් විය්නට ඉඩ තිබේ.

ක්‍රියාකාරකම්

1. ඔබගේ පාසල පිහිටි ගමේ/ නගරයේ පිහිටීම පිළිබඳ තොරතුරු නිවැරදි ව දැන ගැනීම සඳහා පහත සඳහන් වගුව ගුරුතුමාගේ / තුමියගේ ආධාර ඇති ව සම්පූර්ණ කරන්න.

ඔබගේ පාසල පිහිටි ගම / නගරය පිළිබඳ ව සොයා ගත යුතු තොරතුරු	
1. නම.....	.....
2. ග්‍රාම සේවක කොට්ඨාශය.....	.....
3. උප දිසාපති කොට්ඨාශය.....	.....
4. පැනිවරණ කොට්ඨාශය.....	.....
5. දිස්ත්‍රික්කය.....	.....
6. දිස්ත්‍රික්කය පිහිටි පළාත.....	.....

ඔබගේ පාසල පිහිටි ගම / නගරය අවට වෙනත් ගම් / නගර පිහිටා ඇති බව ඔබ දන්නෙහි ය. ඒවා සොයා දැන ගන්න. එම ගම් හෝ නගර පිහිටා ඇත්තේ ඔබගේ පාසල පිහිටි ගමට / නගරයට කිනම් දිශාවකින් දැ යි සොයා බලන්න.

2. 5.1 රූපයේ දී ඇති ආකාරයේ මැදින් දක්වා ඇත්තේ ඔබට අදළ ගම / නගරය ය යි සිතන්න. එය තුළ එම ගමේ / නගරයේ නම් ලියන්න. එයට යාබද ව ඇති වෙනත් ගම්වල / නගරවල පිහිටීම, දිශාව අනු ව සොයා ගෙන ඒවායේ පිහිටීම් ද දක්වන්න.



5.1 රූපය

ගමේ / නගරයේ දළ සැලැස්ම

3. ඔබට දැදළ ගමේ / නගරයේ සිට අවට ඇති ගම්වලට / නගරවලට වැටී ඇති යටින් මාර්ග සොයා ඒවා රතු පාටින් මේ කොටුවේ ඇඳ දක්වන්න.

4. ඔබේ පාසල පිහිටි ගමේ / නගරයේ සිට ප්‍රදේශයේ ප්‍රධාන නගරයට ඇති දුර සොයා ලියන්න.

5. ඔබගේ පොතේ 35 වැනි පිටුවේ ඇති ශ්‍රී ලංකා සිතියමේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හා පළාත් දක්වා ඇත. ඔබේ පාසල පිහිටි ගම අයත් දිස්ත්‍රික්කය නිවැරදි ව හඳුනා ගෙන එය කළු පාටකින් සේයා කරන්න.

6. ඔබ සොයා ගත් දිස්ත්‍රික්කය පිහිටා ඇති පළාත ද හඳුනා ගෙන, දිස්ත්‍රික්කය පාට කළ වර්ණයේම ලා පාටින් එය සේයා කරන්න.

7. ඔබගේ පාසල පිහිටි ගම / නගරය අයත් දිස්ත්‍රික්කය අවට ඇති දිස්ත්‍රික්ක මොනවා දැ යි සොයා ඒවායේ නම් ලියන්න.

8. එ මෙන් ම එම ගම / නගරය පිහිටි පළාත අවට ඇති පළාත් මොනවා දැ යි සොයා ඒවායේ ද නම් ලියන්න.



ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක සිතියම

5.2 රූපය

2. මෙවාගේ කැපී පෙනෙන විශේෂත්වය සොයා බලා ඉන් කිහිපයක් පෙනේ විදිහ ගත කරන්න. කැකි නම් ආකෘති මඟින් පෙන්වීමට ද උත්සාහ ගන්න.



6

ගම්මේ/නගරයේ භෞතික පරිසරය

භූමිය සෑම තැන ම එකාකාර නොවන බව ඔබ මීට පෙර පාසල් වැඩේ දී ඉගෙන ගෙන ඇත. ඔබගේ පාසල අවට ප්‍රදේශය ද එකාකාර නොවිය හැකි ය. එහි කඳු, තැනිතලා, ගංගා ගිඩීමට පුළුවන. කුලපු බොහෝ තිබෙන්නට පුළුවන. එම අංග යම් යම් නාමවලින් හැඳින්වේ.

6.1 භූ ඵිෂමතා ලක්ෂණ

බොහෝ දෙනා විවිධ භූ විෂමතා ලක්ෂණයන් හැඳින්වීමට යරල වචන භාවිත කරනු ලැබේ. "තැන්න" යනු තැනිතලා පෙදෙසකට භාවිත කරන වචනයකි. "පිල්ලැව" යනුවෙන් හැඳින්වෙන්නේ වෙල්යායකට ළං ව ඇති වැලි සහිත සරුතලා බිමකි. මෙසේ දෙණිය, ඩිවිට, මෝදර, ගල, ගිර, කන්ද, පිටිය, වැල්ල, තුඩුව වැනි වචන රාශියක් භූ විෂමතා හැඳින්වීමට ප්‍රාදේශීය වශයෙන් භාවිත වේ. ඔබගේ ප්‍රදේශයේ භූ විෂමතා ලක්ෂණ හැඳින්වීමට භාවිත කරන වෙනත් නම් ද ඇත් නම් ඒවා සොයා දැන ගන්න.

ඔබ ජීවත්වන ප්‍රදේශයේ ගංගා, ඔය, ඇළ, දෙළ, ඇත් නම් ඒවායේ ජලය ගලා යන දිශාව නිරීක්ෂණය කරන්න. ප්‍රදේශය බැවුම් වන්නේ ඒ දිශාවට බව ඔබට වැටහෙනු ඇත. එ වැනි ජල පාරවල් නොවැනි නම් වැසි දිනයක ජලය බැස යන දිශාව සොයා බලන්න. එසේ ජලය බැස යන්නේ ප්‍රදේශයේ බැවුමට අනුකූල ව ය.

ක්‍රියාකාරකම්

1. පහත දැක්වෙන වචන කිසියම් භූ විෂමතා ලක්ෂණවලට සම්බන්ධ වේ. ඒවායේ අර්ථය ඔබගේ ගුරුතුමා / තුමියගේ ආධාරය ඇති ව සොයා අදළ වචනය කෙළින් ලියන්න.

ගල = ...

ඔය = ...

කන්ද = ...

ඇළ = ...

ඩිවිට = ...

මෝදර = ...

තුඩුව = ...

දුව = ...

තොට = ...

පිටිය = ...

වැල්ල = ...

3. ඔබගේ පාසල පිහිටි ප්‍රදේශය උස් බිමක් ද ? තැනිතලා ප්‍රදේශයක් ද ?

.....

4. ඔබගේ ප්‍රදේශයේ ගංගා, ඔය, ඇළ, දෙළ, දිය ඇලි ඇත් නම් ඒවා හඳුන්වන නම් ලියන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

5. ඔබ ප්‍රදේශයේ ඇති විවිධ භූ විෂමතා ලක්ෂණ මිනිස් කටයුතු සඳහා ප්‍රයෝජනයට හෙන ඇති ආකාරය සොයා බලා ඒ ගැන කෙටි විස්තරයක් පොතේ ලියන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

6.2 ගමේ / නගරයේ කාලගුණය

'අද තදින් ම වහිනවා. සෙල්ලම් කරන්න ලැබෙන්නේ නැහැ'
'අද හරි රස්නයි. එතුර සීලා ඉවරයක් නැහැ'

මේ වැනි කියමන් ඔබ බොහෝ විට අසා ඇත. ඒවායින් දක්වෙන්නේ යම් ප්‍රදේශයක කාලගුණික තත්ත්වයන් පිළිබඳ ව ය. දැන් ඔබ එවැනි තත්ත්වයන් ගැන මදක් සිතා බලන්න. තද උණුසුම, අධික වැයි, තද සීතල, වෙගවත් සුළං, ඇනි දිනයන් ඩබට එතක ඇත.

උෂ්ණත්වය, වර්ෂාව, සුළං වැනි දිශාව, වලාකුළු යන තත්ත්වයන්ගෙන් කියියට ප්‍රදේශයක කාලගුණය පිළිබඳ ව දැන ගත හැකි ය.

යම් ප්‍රදේශයක කාලගුණ තත්ත්වයන් පිළිබඳ සිද්ධි පෙර නිමිති දිමට ද (සිදුවීමට කලින් සිදුවන බව කීම) හැකි ය. යමහර කුරුල්ලන්ගේත් මෙරුන්ගේත් මැඩියන්ගේත් හැසිරීම් හා ශබ්ද උදව් කරගෙන බොහෝ දෙනා කාලගුණය පිළිබඳ ව ද අනාවැකි පළ කරති. එ තරම් විද්‍යාත්මක නො වුව ද සාමාන්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීමට මෙ වැනි ගැටි නිරීක්ෂණ ප්‍රයෝජනවත් වේ.

මන්දරම, බක්මහ දැකුණු, ඉල් වැස්ස, වාරකන්, ගොඩ වැස්ස, බිටිම, ඉඩෝරය ආදි වචන වලින් කියැවෙන්නේ කාලගුණය පිළිබඳ අදහස් ය.

ක්‍රියාකාරකම්

1. ඔබ ප්‍රදේශයේ කාලගුණය පිළිබඳ සමහර ලක්ෂණ වර්ෂයේ ඇතැම් මාසවල දී වඩාත් කැපී පෙනේ. 40 වැනි පිටුවේ ඇති වගුවේ අදළ ලක්ෂණ තිබෙන ආය කෙළින් ×ලකුණු යොදන්න.

	ජනාධි	අවාර-වාති	ඵාත්ත	ඵිල්ම්	ඵ්ලැට්	අඹෝස්-තු	සැප්තැම්-බර්	ඔක්තෝ-බර්	නොවැම්-බර්	දෙසැම්-බර්
අධික වැසි										
වියළි										
අධික උෂ්ණත්ව										
ශීතල										
වෙනත් ස්ථාන										

2. පහත සඳහන් වචනවලින් කියවෙන්නේ විවිධ කාලගුණික තත්ත්වයන් පිළිබඳ වාක්‍ය. එම වචන ඉදිරියෙන් ඒවායින් කුමන කාලගුණික තත්ත්වයන් අදහස් කැරේද කියා දක්වන්න.

i. ඉඩෝරය. .....

ii. ඔක්මහ අකුණු .....

iii. වැරහන්. .....

iv. හොඬ වැස්ස. .....

v. මන්දරම. .....

4. ශ්‍රී.ස. 87390

7

ගමේ / නගරයේ සම්පත්

ඔබ අවට ඇති පරිසරයේ ස්වභාවධර්මයෙන් ම ඇති වී නිර්මාණ දේවල් යම්පත් වශයෙන් හැඳින්වේ. වායුව, පස, ඛනිජ, ජලය, ගස්වැල්, පැළෑටි වගේ සම්පත්වලට නිදසුන් කිපයකි.

7.1 ප්‍රදේශයේ සම්පත්

එකිනෙක ප්‍රදේශයේ ඇති වැදගත් ම සම්පත්වල **පස**. සවිතර ගම්වල / නගරවල වටිනා ඛනිජ විර්ණ ද නිරීක්ෂණය කිරීමට පුළුවන. එවා ඇත් නම් එසේ **පස** ගන්න. සෑම ප්‍රදේශයකම **පස** දැක. ඒවා පාසල්වල විද්‍යාගාරවල වැඩිමට ප්‍රයෝජනවත් වේ.

සෑම ස්ථානයක ම **පස** එකාකාර නැ පස්වල වෙනස්වීම අනුව වවන බෝග වර්ග ශ්‍රේණිගත වේ. මේ නිසා **පස්** වටිනා සම්පතකි. එ **සැලකිලිමත්** වෙමින් ආරක්ෂා කර ගැනීම අපගේ යුතුකමයි.

ක්‍රියාකාරකම

1. ඔබගේ ප්‍රදේශයේ **පස** හෝදි යෑම වළක්වා ගැනීමට උපයෝගී කරගෙන ඇති ක්‍රම මොනවා ද යි සොයා දැනගන්න. එවැනි ක්‍රම ඇත් නම් පහතින් ලියන්න.

2. **පස** ආරක්ෂා කිරීමට ඔබට හැකි **ක්‍රියා මාර්ග** 2ක් ලියන්න.

1. .....

.....

2. .....

.....

.....

ඔබගේ පාසල් වත්තේ ස්වාභාවික ව වැඩුණු ගස් වැල් පැළෑටි ගැන සොයාගෙන් ආකාරයට ම ඔබගේ ප්‍රදේශයේ ස්වාභාවික ගස්වැල් පැළෑටි ද හඳුනාගන්න.
ඔබගේ ප්‍රදේශයේ **ගස්** සිටුවීමේ උත්සව දිනයක් ඔබට සිහිපත ද ? එම දිනයක සිටුවූ ගස් ඇත්ද යි සොයා බලන්න. ස්වභාවික ස්වභාවයෙන් වැඩුණු ගස් නොවේ. රෝපණය කළ ගස් ය.

ක්‍රියාකාරකම

3. ඔබගේ ප්‍රදේශයේ දක්නට ලැබෙන ගස්වැල් සහ පැළෑටි වර්ග ස්වාභාවික හා වවන ලද ඒවා වශයෙන් වෙන් කරගෙන පහත සඳහන් වගුවේයි දක්වන්න.

ස්වාභාවික ව වැඩුණු ගස්වැල් පැළෑටි	වවන ලද ගස්වැල් පැළෑටි
1.	.....
2.	.....
3.	.....
4.	.....
5.	.....
6.	.....
7.	.....
8.	.....
9.	.....
10.	.....
11.	.....
12.	.....

4. ඉහත සඳහන් ලැයිස්තුවෙන් පහත සඳහන් ප්‍රයෝජන ඇති වර්ග ඇත් නම් ඒවා ඒ කෙළින් ලියන්න.

.....

i. බෙහෙත් වර්ග :—.....

ii. වටිනා ලී වර්ග :—.....

iii. අලංකාර මල් වර්ග හා ගස් වර්ග:— .....

iv. ආහාරයට ගන්නා වර්ග :—.....

v. කොළ කැඳවලට සුදුසු වර්ග :—.....

5. ඔබගේ උපන් දින උත්සවය සිහිකිරීම සඳහා සිහිවටනයක් වශයෙන් ඔබගේ ගෙවත්තේ පැළෑටි රෝපණය කරන්න. එය ආදරයෙන් රැක බලා ගන්න. එය වැඩෙන ආකාරය නිතර ම නිරීක්ෂණ කරන්න. ඔබ වැඩි වියට පත් වූ විට ද ඔබගේ ළමා අවධිය සිහිවීමට මේවා වැදගත් සිහිවටන වනු ඇත.

මෙම පාඩම පිළිබඳ අතිරේක කියවීම සඳහා "ජනගහන අධ්‍යාපන අතිරේක කියවීම 6 ශ්‍රේණිය"නමැති පොතේ ජනගහනය සහ ස්වාභාවික සම්පත් යන කොටස කියවන්න.

8

ගමේ / නගරයේ මිනිසුන් හා මිනිස් කටයුතු

ඔබ ද ඔබ පවුලේ අය ද ගමේ / නගරයේ වාසය කරන අය වෙති. එ බඳු පවුල් ගණනාවක් එකතු වී ගම් / නගරය සැදේ.

ඔබ ද සාමාජිකයකු වන පවුල ගැන විකක් සිතා බලන්න. එහි සාමාජිකයන් අතර ද විවිධ වෙනස්කම් දක්නට ලැබේ. වයස අනු ව, උස්මිට භාවය අනු ව, යමේ වර්ණය අනු ව, හැකියාවන් අනු ව, ගතිගුණ අනු ව, ආවාස්කම් දක්නට ඇත. ගමේ නගරයේ වැසියන් අතර ඊට වැඩි විවිධත්වයක් පෙනෙන්නට ඇත.

ගමේ / නගරයේ වාසය කරන අය හා ඔවුන්ගේ විවිධත්වය ගැන තොරතුරු විමසා දැන ගැනීමට පහසු ක්‍රමයක් සිතා බලන්න. එම තොරතුරු විමසීම සඳහා පහත දැක්වෙන ආකාරයට ද ඔබට ක්‍රියා කළ හැකි ය.

ගුරුතුමා / ගුරුතුමියගේ ආධාර ඇති ව පාසල පිහිටි ග්‍රාම සේවක වසම හාර ග්‍රාම සේවක නිලධාරී තැනගෙන් අසා පහත දැක්වෙන ප්‍රශ්නාවලියට පිළිතුරු සටහන් කරන්න.

ක්‍රියාකාරකම්

1. පාසල පිහිටි ග්‍රාම සේවක වසමට අයත් පවුල් සංඛ්‍යාව .....

2. විවිධ වර්ගවලට අයත් පවුල් සංඛ්‍යාව

සිංහල ..... දෙමළ ..... යෝනක ..... වෙනත් .....

3. විවිධ ආගම් අදහන පවුල් සංඛ්‍යාව

බෞද්ධ..... හින්දු ..... ඉස්ලාම් ..... ක්‍රිස්තියානි.....

4. ඔබ සටහන් කර ගත් තොරතුරු අනුව ඔබේ ගමේ / නගරයේ වැසියන් පිළිබඳ ව තොරතුරු විස්තර කරමින්, දුර පළාතක හෝ වෙනත් රටක සිටින ඔබගේ මිතුරකුට යැවිය හැකි ලිපියක් සකස් කරන්න.

.....

.....

.....

.....

.....

.....

පවුලේ දියුණුවට එහි සාමාජිකයන්ගේ එකමුතු බව හා ක්‍රියාශීලි සහයෝගය වැදගත් වන්නා සේ ම ගමේ / නගරයේ දියුණුවට ද එහි වැසියන්ගේ එකමුතු බව හා ක්‍රියාශීලි සහාය වැදගත් ය.

නොයෙකුත් අවස්ථාවල දී ගමේ / නගරයේ වැසියන් එකතු වී කටයුතු කරන ආකාරය ඔබ අසා තිබෙන්නට පුළුවන. එසේ එක් වී කටයුතු කරන පොදු හා පෞද්ගලික අවස්ථා කිහිපයක් පහත දක්වේ.

ක්‍රියාකාරකම්

5. ඒ ඒ අවස්ථාවල දී ගමේ / නගරයේ වැසියන් අතර ඉස්මතු වී පෙනෙන ගති පැවතුම් හා අනුගමනය කරන සිරිත් විරිත් සඳහන් කරන්න.

i. ගොයම් කැපීමේ අවස්ථාවක දී

.....

.....

.....

.....

.....

ii. වහලක් සෙවිලි කරන අවස්ථාවක දී

.....

.....

.....

.....

iii. ග්‍රාමීය ව්‍යාපාරයක් පවත්වන අවස්ථාවක දී

.....

.....

.....

.....

.....

.....

iv. ක්‍රීඩා උත්සවයක දී

.....

.....

.....

.....

.....

v. අවමඟුල් උත්සවයක දී

.....

.....

.....

.....

.....

.....

.....

.....

ගමක හෝ නගරයක ජීවත් වන අය විවිධ රැකියාවල යෙදී සිටිති. සමහර ගොවි-තැනෙහි යෙදෙති. තවත් අය ... ආදීන්වල ද ඇතැමෙක් විවිධ සේවාවන් ආශ්‍රිත රැකියා-වල ද නියුක්ත වෙත්.

8.1 ගොවිතැන

ඔබේ ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු යෙදෙන දක්ෂ ගොවීන් සිටිය හැකි ය. ඔබේ පියා හෝ සහෝදරයන් හෝ දක්ෂ ගොවීන් වන්නට පුළුවන.

ක්‍රියාකාරකම්

1. ඔබ ප්‍රදේශයේ වගා කරන බෝග වර්ග ලැයිස්තුවක් පිළියෙළ කරන්න. මේවා අතර සමහර බෝග වර්ග ඔබේ ගෙවත්තේ ද වගා කර තිබෙන්නට පුළුවන. එසේ සකස් කළ බෝග ලැයිස්තුවෙන්, ඔබේ එදිනෙදා ආහාරය සඳහා පමණක් ප්‍රයෝජනයට ගන්නා බෝග වර්ග විකිණීම සඳහා වගා කරන බෝග වර්ග ද වෙන් වශයෙන් හඳුනා ගන්න. විකිණීම සඳහා වගා කරන බෝග ගමෙන් බැහැර ප්‍රදේශවලට හෝ ඇතැම් විට පිටරටවලට යැවීම ද සිදුවේ.

ප්‍රදේශයේ වවන බෝග වර්ග	ප්‍රදේශයේ වවන බෝග අතරින් එදිනෙදා ආහාරයට ප්‍රයෝජනයට ගන්නා බෝග	වෙළෙඳාම් සඳහා වගා කරන බෝග

2. ප්‍රදේශයේ දක්ෂ ගොවීන් කිහිප දෙනෙකු පිළිබඳ ව, දෙමව්පියන්ගෙන් හෝ අසල්වැසි වැඩිහිටියකුගෙන් අසා දැන ගන්න.

3. ඔබේ පන්තියේ මිතුරන් දෙදෙනෙකු ද සමඟ නිදහස් වේලාවක ගොවි මහතෙකු හමු වී වගා කරන බෝග හා ඒ සම්බන්ධ කටයුතු පිළිබඳ තොරතුරු අසා සටහන් කර ගන්න. පහත සඳහන් කරුණු දැනගැනීම ඔබට වැදගත් විය හැකි යි.

වගා බිමවල විශාලත්වය

වගා කරන බෝග වර්ග හා ඒවා වගා කිරීම සඳහා පස සකස් කරන ආකාරය

පැළ හෝ ඇට සිටුවන ආකාරය – වගාවට ජලය ලබා ගන්නා සැටි

පොහොර යොදන ක්‍රම, වගාවට වැළඳෙන ලෙඩ රෝග හා ඒවා මර්දනය කරන අයුරු

අස්වැන්න ලබා ගැනීමට ගත වන කාලය සහ ආකාරය.

වගාව සඳහා භාවිත කරන උපකරණ

4. මේ සාකච්ඡාවලින් ඔබ ලබා ගත් තොරතුරු උපකාර කර ගෙන පාසල් සහරාවේ පළ කිරීම සඳහා "අපේ ගමේ බෝග වගාව" යන මාතෘකාව යටතේ වචන 150 ක පමණ රචනයක් ලියන්න.

5. විකිණීම සඳහා වගා කරන බෝග ඒවා වගා කරන ප්‍රදේශයෙන් පිටට මෙන් ම පිටරටවලට ද විකුණනු ලැබේ. ඔබේ ගමේ / නගරයේ ගොවිතැන දියුණු කිරීම සඳහා උපදෙස් හා ආධාර ලබා දෙන ආයතන මෙන් ම නිලධාරිනු පිරිසක් ද සිටිති. ගුරුතුමා / තුමිය ගේ ආධාර ඇති ව එවැනි ආයතන හා නිලධාරීන්ගේ ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
එම ආයතනවලින් හා නිලධාරීන්ගෙන් ඔබේ ගමට / නගරයට සිදු වන සේවාවන් සොයා බලා සටහන් කරන්න.

නිල නාමය	සිදුවන සේවය

2.8 කර්මාන්ත

ගමේ / නගරයේ වසන සියලු දෙනා ම හොඳයෝ නොවෙත්. විවිධ කර්මාන්තවල නියුතු පිරිසක් ද එහි සිටිති. කිසියම් අමු ද්‍රව්‍යයක් ප්‍රයෝජනයට ගනිමින් ශිල්පිය දැනුම, උපකරණ හා ශ්‍රමය උපකාරී කර ගෙන ප්‍රයෝජනයක් ගත හැකි භාණ්ඩ නිපදවීම කර්මාන්ත ලෙසින් දළ වශයෙන් හඳුන්වමු.

විශාල පිරිසක් වැය කොට කර්මාන්ත ශාලා-වක කම්කරුවන් සිය ගණනක් යොදවා භාණ්ඩ නිපදවන කර්මාන්ත වෙන් ම, අඩු මුදලක් කොට සුළු කම්කරු පිරියක් යොදා භාණ්ඩ වන කර්මාන්ත ද ඇත. ගෙදර දොර අවට පිහිය, කැත්ත, උදැල්ල, පුටු, මේස, ගෙදී පිහන් බඩු ආදී දේ ගැන සිතන්න. මේවා එකක් හෝ වැඩි සංඛ්‍යාවක් ඔබ ගමෙහි ද නිපදනය කරනවා විය හැකි ය.

ක්‍රියාකාරකම්

1. ඔබේ ගමේ / නගරයේ නිපදවන භාණ්ඩවල නාම ලේඛනයක් පහත සඳහන් වගුවේ ලියන්න. ඒ ලියන ලද භාණ්ඩ නිපදවීම සඳහා භාවිත කළ අමු ද්‍රව්‍ය මොනවා දැයි ඒ භාණ්ඩය පෙළ ලියන්න. උදාහරණ පුටුව — ලී.

භාණ්ඩය	සැදී ඇති ද්‍රව්‍ය
1.	
2.	
3.	
4.	
5.	

2. ඔබගේ ගමේ / නගරයේ ඇති කිසියම් කර්මාන්තයක් සම්බන්ධ කොට ගෙන සහරාවේ පළ කිරීමට ලිපියක් සකස් කරන්න. එම ලිපිය පිළියෙළ කිරීම සඳහා පහත සඳහන් කරුණු දැන ගෙන නොරතුරු සපයා ගන්න.

i. කර්මාන්තය සඳහා යොදා ගත් අමු ද්‍රව්‍ය.....

ii. ඒවා ලබා ගන්නා ස්ථාන.....

iii. නිපදවන භාණ්ඩ .....

iv. කර්මාන්තයේ නියුතු කම්කරු සංඛ්‍යාව. .....

v. කර්මාන්තය සඳහා යොදන බලය. .....

vi. භාණ්ඩ විකිණීමට ගන්නා පියවර .....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

3. ඔබ දුටු කර්මාන්තයක භාණ්ඩ නිෂ්පාදනය කරන ආකාරය වුල සිද්ධ වියදිමරුන් පියවර විස්තර කරන්න.

8.3 ගමට/නගරයට සැපයෙන සේවා

ගමේ/නගරයේ වසන සියලු දෙනා ම එක මිනිස් පවුලක් ලෙස කටයුතු කිරීමේ වැදගත්කම ඔබ දැන් අවබෝධ කරගෙන ඇත. අපගේ සියලු අවශ්‍යතා අපට තනි ව ම සපුරා ගත නොහැකි ය. එමෙන් ම ගමකට ද ගම් වැසියන්ගේ ඕනෑ එපාකම් සියල්ල ම තමන්ට ම සපුරා ගත නොහැකි ය.

මේ ඕනෑ එපාකම් සම්පූර්ණයෙන් සපුරා ගැනීම සඳහා අපට කිසියම් පිරිසකගේ හෝ සංවිධානවල සහාය දිනපතා ම අවශ්‍ය වේ. මෙසේ ජනතාවගේ පොදු ඕනෑ එපාකම් ඉටුකර ගැනීම සඳහා පුද්ගලයකුගෙන් හෝ සංවිධානයකින් ලබා ගන්නා සහාය සේවාවන් ලෙස දළ වශයෙන් හැඳින්විය හැකි ය.

ඔබේ ගමට/නගරයට සැපයෙන සේවාවන් ගැන සිතා බලන්න. අපට එදිනෙදා ජීවිතයට අවශ්‍ය කරන ආහාර, ඇඳුම් හා වෙනත් දෑ සපයන්නෝ වෙළෙන්දෝ ය. අපට බඩු ඔබ මොබ ගෙන යැමටත්, ගමන් බිමන් යැමටත් ප්‍රවාහන සේවය අවශ්‍ය වේ. දුරබැහැරක සිටින නෑයන්ට කිසියම් පණිවිඩයක් යැවීමට තැපැල් සේවාව ද අවශ්‍ය වේ. හදිසියේ යම්කෙනෙකු අසනීප වුවහොත් ඔහුට පිහිට වන්නේ ප්‍රදේශයේ වෛද්‍යවරයා යි.

ගමේ/නගරයේ සනීපාරක්ෂාව පිළිබඳ කටයුතුවල දී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා මිනිසුන්ට සහාය වෙයි.

මේ අයුරින් ම ජලය සැපයීම, ආලෝකය සැපයීම, ආරක්ෂාව සැලසීම ආදී විවිධ අංග වලින් ගමට/නගරයට සේවාවන් සැපයෙන බව ඔබ දන්නවා ඇත. මේ සේවාවන් රජයේ ආයතන විසින් ද පෞද්ගලික ආයතන විසින් ද ස්වේච්ඡා සංවිධාන විසින් ද ඉටු කරනු ලැබේ.

ක්‍රියාකාරකම්

1. ඔබේ ගමට/නගරයට සැපයෙන සේවා පහත දක්වෙන ආකාරයට වර්ග කර දක්වන්න.

රජයේ ආයතන මඟින් සැපයෙන සේවා	පුද්ගලික ආයතන මඟින් සැපයෙන සේවා	ස්වේච්ඡා සංවිධාන මඟින් සැපයෙන සේවා

සමූපකාර කඩයක්

සළු සල මාලිගාවක්

ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා ශාඛාවක්

තැපැල් කාර්යාලයක්

ලංගම ඩිපෝවක්

පොලිස් කාර්යාලයක්

2. 56 පිටුවේ ඇති හිස් කොටුවල ඒවායේ සඳහන් සේවා ආයතන දක්වෙන චිත්‍ර අඳින්න. ඔබ ප්‍රදේශයේ විවිධ සේවාවන් ඉටු කරන ඒ ඒ ආයතන සහ සංවිධාන මගින් ඔබ ගමට/ නගරයට ඉටු වන සේවාවන් නම් කරන්න.

5. මු.ස. 87390

3. මෙම සේවා හැර ඔබ ගමේ/නගරයේ ඇති වෙනත් සේවා මොනවාද ?

4. එම සේවාවන් භුක්ති විඳීමේ දී ඔබෙන් ඉටු විය යුතු යුතුකම් විස්තර කරමින් වචන 100ක කුඩා රචනයක් ලියන්න

9

අපේ ගමේ / නගරයේ ඉතිහාසය

මීට පෙර ඔබ පාසලේ ඉතිහාසය පිළිබඳ ව හොරතුරු ඉගෙන ගත්තෙමු ය. එමෙන් ම ඔබ පාසල පිහිටා ඇති ගමේ / නගරයේ ඉතිහාසය ද සොයා දැන ගැනීම ඔබට වැදගත් වනු ඇත. හැම ගමකට හෝ ම නගරයකට ම දිර්ඝ හෝ කෙටි ඉතිහාසයක් තිබෙන බව කිව හැකි ය. යම් හෝ නගරය යම් කලක දී ජනාවාස වී ක්‍රම ක්‍රමයෙන් දියුණු වී අද පවතින තත්ත්වයට පත් වී ඇත. ඉතා වැනක දී බිහි වූ උදඟලි සංකල්පය නිසා ගම් ගණනාවක් ම ඇති වූ බව ඔබ දන්නවා ඇත. පාසලේ ඉතිහාසය සෙවීමේ දී යම් යම් ප්‍රයෝජනයට ගත් ආකාරයට ම ගමේ / නගරයේ ඉතිහාසය ගැන කරුණු සෙවීමේ දී උපයෝගී කර ගත හැකි දෑ රොසායනියක් ඇත. ජන ප්‍රවාද, ස්මාරක, පොඩනැඟිලි, ලිපි ලේඛන ඉන් යම්තරකි. එවා ආශ්‍රයෙන් ගමේ / නගරයේ ඉතිහාසය සෙවීම ප්‍රයෝජනවත් පෙරෝ ම රසවත් ක්‍රියාවක් විනාඩා නො අනුමානය.

ක්‍රියාකාරකම

1. ඔබේ ගම / නගරය හඳුන්වන නාම ඇති වීමට හේතු වූ පෙනිසාධන හොරතුරු හෝ ඒ විෂා යාවත් ඇති ජන ප්‍රවාද සිඹෙන්නට පුළුවන. ඒ පිළිබඳ ව කරුණු සොයා පෙති රසවිඳෙන් ලියන්න.

2. **ඔබේ / ඔබේ නගරයේ පිහිටි ඓතිහාසික නොඩනැගිලි හා ස්මාරක පිළිබඳ ලැයිස්තුවක් පිළියෙළ කරන්න. ඒවා ඉදි කරන ලද දින ඇසුරෙන් ඔබ තෝරා ගත් නාම් ඒ පිළිබඳව ඉදිරියෙන් ලියන්න**

.....

.....

.....

3

ඒකකය

අපේ රට

10

ගමේ / නගරයේ පාලනය

මීට පෙර පාඩමෙක දී ඔබ පාසලේ පාලනය ගැන ඉගෙන ගත්තෙහි ය. මේ පාඩමේ දී ඔබ පාසල පිහිටි ගම් හෝ නගරය පාලනය වන ආකාරය ගැන ඉගෙන ගන්නවා ඇත. අපේ රටෙහි මහා ආණ්ඩුව සියලු ම පුරවැසියන්ට පොදුවේ බලපාන ජාතික ප්‍රශ්න විසඳීමත් මුළු රටේ ම සංවර්ධනය සඳහාත් ක්‍රියා කරයි. මේ නිසා එක් එක් ප්‍රදේශවලට සීමා වන ප්‍රාදේශීය වශයෙන් වැදගත්කමක් ඇති ප්‍රශ්න ගැන කටයුතු කිරීමට බොහෝ විට අවස්ථා නො ලැබේ. මේ නිසා ඒ ඒ පළාත්වලට ම විශේෂ වන ප්‍රශ්න ගැන සොයා බලා ක්‍රියා කිරීමට පළාත් පාලන ආයතන සහ සංවර්ධන සහා පිහිටුවා ඇත. මුළු රටට ම පොදු සේවා සමූහයක් මහ ආණ්ඩුවෙන් ඉටු කෙරෙන අතර ගමකට හෝ නගරයකට විශේෂ වන සේවා මෙම පළාත් පාලන ආයතනවලින් සිදු වේ. අද අප රටෙහි ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන නම් වන්නේ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සංවර්ධන සභා හා ග්‍රාමෝදය මණ්ඩල යි. එක් එක් ප්‍රදේශවල වැසියන්ට තම නියෝජිතයන්ගේ මාර්ගයෙන් මෙකී පළාත් පාලන ආයතනවලට සහභාගි වීමට අවස්ථා ඇත.

ක්‍රියාකාරකම්

ඔබේ පාසල පිහිටි ගමේ හෝ නගරයේ පාලනය පමණ සඳහන් සැලැස්ම අනුව අධ්‍යයනය කරන්න.

1. ගම හෝ නගරය පාලනය කරන පළාත් පාලන ආයතන නම් කරන්න.

   .....

2. ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා හැඳින්වෙන නිල නාමය කුමක් ද ?

   .....

3. ඔබේ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට සාමාජිකයන් තෝරා ගන්නේ කෙසේ ද ?

   .....

   .....

   .....

   .....

   .....

   .....

   .....

6. මු.ස. 87390

4. ප්‍රදේශයේ වැසියන් පාලනයට සම්බන්ධ වන ආකාරය දක්වන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

10.1 නීති රීති

ලුළු රටට පාලනය කිරීම සඳහා අවශ්‍ය වන නීති රීති සකස් කරන්නේ මහා ආණ්ඩුව තුළත් පාර්ලිමේන්තුව ය. ගමක් හෝ නගරයක් පාලනය කිරීට සඳහාක් නීති අවශ්‍ය ය. මේ නිසා ප්‍රධාන නීතිවලට අමතර ව අතුරු නීති සෑදීමට සිදු වේ. එක් එක් පළාත් පාලන සභාවලට තම නිල ප්‍රදේශයේ පමණක් ක්‍රියාත්මක කළ හැකි නීති සාදා ගැනීමට මහා ආණ්ඩුවෙන් බල යලසා දී ඇත. මෙ වැනි නීති ප්‍රධාන වශයෙන් ගමේ/නගරයේ පාලනය යටතේ ඇති සේවාවන් හා ඒ සඳහා වුවමනා කරන මුදල් යෙදවීම ගන්නා ක්‍රියාවලියන් සකස් වී ඇති ඒවා ය. පළාත් පාලන ආයතනයේ නීති රීති පිළිපැදීම ගමේ නගරයේ වැසියන්ගේ යුතුකමකි. ඒවාට අවනත වීමෙන් ප්‍රදේශයේ පාලන කටයුතු වඩාත් පහසුවෙන් කර ගෙන යා හැකි ය.

ක්‍රියාකාරකම්

1. ඔබ පාසල පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය මඟින් සිදු කරන සේවාවන් ලියන්න.

.....

.....

.....

.....

.....

.....

2. මෙම සේවාවන් ඉටු කිරීම සඳහා ක්‍රියා කරන නිලධාරීන් පස් දෙනකු නම් කරන්න.

.....

.....

.....

.....

.....

3. පළාත් පාලන ආය... අවශ්‍ය මුදල් ලබා ගැනීමට යොදා ගන්නා ක්‍රම 5 ක් ගුරුතුමා/ගුරුවරියගෙන් අසා ලියන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

යුතුකම් හා අයිතිවාසිකම්

පවුලක හෝ පාසලක දියුණුව සඳහා ඒවායේ සාමාජිකයන්ගේ සහයෝගය හා සහභාගිත්වය වැදගත් වන ආකාරයට ම ගමේ හෝ නගරයේත් පොදු කටයුතු සාර්ථක ලෙස ඉටු කර ගැනීමට පළාතේ වැසියන් එක්සත් ව ක්‍රියා කළ යුතු ය. ගමක හෝ නගරයක ජීවත් වන වැසියන්ට යම් යම් අයිතිවාසිකම් හිමි වන අතර ම ඔවුන්ගෙන් ප්‍රදේශයට යම් යම් යුතුකම් ද ඉටු විය යුතු ය. උදා:- බීම සඳහා පිරිසිදු ජලය ලබා ගැනීම ප්‍රදේශයේ වැසියන්ගේ අයිතිවාසිකම් වන අතර තම වාසස්ථාන අවට පිරිසිදු ව තබා ගැනීම ඔවුන්ගේ යුතුකමකි. ගමේ හෝ නගරයේ ජීවත් වන වැසියන් තම අයිතිවාසිකම් ලබා ගත යුතුවාක් මෙන් ම යුතුකම් ද නොපිරිහෙලා ඉටු කළ යුතු ය.

ක්‍රියාකාරකම්

1. ඔබ පාසල පිහිටි ගමේ / නගරයේ වැසියන්ගෙන් ඉටු විය යුතු යුතුකම් හා ප්‍රදේශයේ වැසියන් වශයෙන් හිමි විය යුතු අයිතිවාසිකම් පහත සඳහන් තීරු දෙකේ ලියන්න.

යුතුකම්	අයිතිවාසිකම්

11

ජාතික ගීය - ජාතික කොඩිය - රාජ්‍ය ලාංඡනය

විවිධ ආර්ථික, ආගමික අනින් වෙනස්කම් තිබුණ ද අපි සියලු දෙනාට ම එක ම රටක රටවැසියෝ වෙමු. ශ්‍රී ලාංකිකයන් වන අපට ජාතික සමගිය හා ජාතික ප්‍රගතිය ඇති කර ගැනීමේ ලා අපේ ජාතික ගීය, ජාතික කොඩිය හා රාජ්‍ය ලාංඡනය වැදගත් වේ.

11.1 ජාතික ගීය.

ජාතික ගීයේ නිර්මාතෘවරයා සුප්‍රකට ගායකයකු වූ ආනන්ද සමරකෝන් මහතා ය. අපේ රටට වාගේ ම අනෙකුත් රටවලට ද ජාතික ගී ඇත. මේවායින් පිළිබඳ ව හක්නියක්, ගෞරවයක් මෙන් ම අභිමානවත් හැඟීමක් ද ඇති කිරීම ජාතික ගීයක මූලික අදහස යි.

1948 පෙබරවාරි 04 වෙනි දින කොළඹ නිදහස් චතුරශ්‍රය ඉදිරිපිට පැවති ප්‍රථම නිදහස් උත්සවයේ දී පළමු වන වරට අපේ ජාතික ගීය ගායනා කරනු ලැබී ය.

විවිධ අවස්ථාවන්හි දී ජාතික ගීය ගායනා කිරීම සම්ප්‍රදායකි. ජාතික ගීයට නිසි ගරු බුහුමන් දක්වීම අපේ යුතුකමකි.

ක්‍රියාකාරකම්

1. ගුරුතුමා / තුමියගේ මෙහෙයවීම යටතේ පන්තියේ දී ජාතික ගීය ගායනා කරන්න.

2. අප ජාතික ගීයේ නිර්මාතෘවරයාගේ නම් ලියන්න.

.....

.....

3. එහි අර්ථය සරල ව දක්වන්න.

.....

.....

.....

.....

.....

.....

.....

4. ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා මොනවා ද සි යටහන් කරන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

5. ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථාවන්හි දී ඔබ හැසිරිය යුතු ආකාරය ඔබෙ ගුරු මහතා/ මහත්මියගෙන් අසා දැන ගන්න.

.....

.....

.....

.....

11.2 ජාතික කොඩිය

යම් රටක ජාතික එකමුතුකම පෙන්වීම සඳහා භාවිතා කෙරෙන ප්‍රබල සංකේතයකි, ජාතික කොඩිය. ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය හොඳින් පරීක්ෂා කර බලන්න. සිංහ කොඩිය අපේ ජාතික කොඩිය යි.

කඩුවක් අතින් ගත් සිංහයාට අමතර ව විවිධ වර්ණ හා සංකේත එහි අඩංගු වී ඇති බව ඔබට පෙනී යනවා ඇත.

අද අප භාවිත කරනු ලබන සිංහ කොඩියට දීර්ඝ ඉතිහාසයක් ඇත.

ඉන්දියාවේ සාංචි ස්තූපයේ ලංකාවේ මුල් රජු විශයෙන් සැලකෙන විජය කුමරු ලංකාවට පැමිණීම නිරූපනය වෙතැ යි විශ්වාස කරන කැටයමක සිංහ රූපයක් සහිත කොඩියක සටහනක් ඇත. මෙය සමහර විට ආදි සිංහලයන්ගේ ගෝත්‍ර සලකුණ විය හැකි ය. එය විකාශනය වී ජාතික කොඩියේ සිංහ ලාංඡනය බවට පත් වූයේ විය හැකි ය. කෝට්ටෙ යුගයේ දින්, මහනුවර යුගයේ දීත් සිංහ කොඩිය ජාතික කොඩිය ලෙස භාවිත කර ඇත. අද අප ගාවිත කරන ජාතික කොඩිය මහනුවර රජ කළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය පදනම් කරගෙන යකස් කර ගත්තකි.

1948 මාර්තු 06 වන දින දී එවකට ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ඩී. ඇස්. සේනානායක මහතා විසින් පත් කරන ලද සියලු ම ජනවාර්ගික නියෝජිත යන්ගෙන් සැදුම් ලද කමිටුවක නිරණය පරිදි වර්තමාන ජාතික කොඩිය බිහිවිණි. එහි සභාපති විශයෙන් කටයුතු කරන ලද්දේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ය. ටී. බී. ජයා, ජී. ජී. පොන්නම්බලම් යන මහත්වරු ද කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

ප්‍රධානාධිපති ගරු ජේ. ආර්. ජයවර්ධන මහතා ද ජාතික කොඩි සැකසුම් කමිටුවේ සාමාජිකත්වය දැරි ය.

ජාතික කොඩිය ශ්‍රී ලාංකික අප සියලු දෙනා-ගේ ම වස්තුවකි. රට නිසි ගරු ගුණුවත් දක්වීමත් ජාතික කොඩිය යටතේ එක්සත් වී එක්සිත් ව කටයුතු කිරීමත් අප කාගේත් පරම යුතුකමකි.



11.1 රූපය. ශ්‍රී ලංකා ජාතික කොඩිය

ක්‍රියාකාරකම්

(1) ජාතික කොඩිය චිත්‍රයකට නඟන්න.

(2) ජාතික කොඩියේ පහත සඳහන් **සංකේතවලින් නිරූපණය** වනුයේ කුමක් **දැ යි දක්වන්න.**

(අ) කඩුවක් අල්ලා ගත් සිංහයා.....

.....

.....

(ආ) බෝපත්

.....

.....

(ඇ) වර්ණ තුන.....

නැගිලි පාට.....

.....

කොළ පාට.....

.....

